# ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මෙහෙයවන වාර්තා චිත්‍රපට තරඟය

මෙම තරඟය වයස් භේදයකින් තොරව, තනිව හෝ කණ්ඩායම් වශයෙන් ඕනෑම අයෙකුට සහභාගී විය හැකි විවෘත තරඟයකි.

**මූලික සුදුසුකම් සහ තාක්ෂණික නීති**

- **මාතෘකාව:**දෙපාර්තමේන්තුව විසින් යෝජිත දේවස්ථාන ලැයිස්තුව අතුරින් එක් දේවස්ථානයක් පිළිබඳ වාර්තා චිත්‍රපටයක් විය යුතුය.
- **කාල සීමාව:**විනාඩි**15 - 20**ත් අතර.
- **භාෂාව:**සිංහල හෝ දෙමළ (නමුත් **ඉංග්‍රීසි උපසිරැසි / Subtitles** තිබීම අනිවාර්ය වේ).
- **ආකෘතිය (Format):MP4**ගොනුවක් ලෙස භාර දිය යුතුය.
- **විශේෂ තාක්ෂණය:**පැරණි දර්ශන ප්‍රතිසංස්කරණය/පෙන්වීම සඳහා අත්‍යවශ්‍ය අවස්ථාවන් වලදී පමණක් **AI (කෘතිම බුද්ධිය) තාක්ෂණය** භාවිත කළ හැක.
- **නාමාවලිය:**චිත්‍රපටය අවසානයේ දායක වූවන්ගේ නාමාවලිය (Credits) ඇතුළත් විය යුතුය.
- **වාර්තා චිත්‍රපටයේ අන්තර්ගතය -** දේවස්ථායේ ඉතිහාසය, පසුබිම, දේවස්ථානය හා බැඳුනු පුරාවෘත, විශේෂ ප්‍රතිමා ඇත්නම් එහි විශේෂත්වය, ප්‍රාතිහාර්යයන්, දේවස්ථානයට ආවේනික වූ සිරිත් විරිත් හා උප සංස්කෘතිය, දේවස්ථාන මංගල්‍ය හා විශේෂ නුවාන වැනි තොරතුරු අන්තර්ගත කළ යුතු අතර, එකී තොරතුරු නිවැරදි බවට මීසම් පාලක පියතුමා විසින් තහවුරු කර තිබිය යුතු ය.
- **අයදුම්පත් යොමු කිරීම -** අයදුම්පත් යොමු කිරීමේ අවසාන දිනය 2026.09.04 වේ. අයදුම්පත් අධ්‍යක්ෂ, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, 180, 3 වන මහළ, කොළඹ 10. යන ලිපිනයට හෝ minchris@sltnet.lk විද්‍යුත් තැපැල වෙත යොමු කළ යුතු ය

## අනිවාර්ය අනුමැතිය

වාර්තා චිත්‍රපටයේ තිර පිටපත (Script) සහ අවසන් නිර්මාණය අදාළ **මීසම් පාලක පියතුමාගේ** අධීක්ෂණයට යොමු කළ යුතුය. එහි සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සනාථ කරමින් එතුමා විසින් නිකුත් කරන **නිල සහතික කිරීමේ ලිපිය** චිත්‍රපටය සමග දෙපාර්තමේන්තුවට භාර දීම අනිවාර්ය වේ.

## සහභාගී විය හැකි ආකාරය

- එක් අධ්‍යක්ෂ වරයෙකුට අධ්‍යක්ෂණය කළ හැක්කේ එක් වාර්තා චිත්‍රපටයක් පමණි.
- අධ්‍යක්ෂණය හැර වෙනත් කාර්යයක් සඳහා එක් ශිල්පියෙකුට වාර්තා චිත්‍රපට එකක ට වඩා වැඩි ප්‍රමාණයකට සහභාගි විය හැක.
- එක් දේවස්ථානයක් පිළිබඳව නිර්මාණය කළ හැක්කේ එක් වාර්තා චිත්‍රපටයක් පමණි.
- **අයදුම්පත දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට ප්‍රථම තමන් චිත්‍රපටය නිපදවීමට අදහස් කරන දේවස්ථානය වෙනත් පුද්ගලයෙක්/කණ්ඩායමක් විසින් වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට අයදුම් කර නොමැති බවට දෙපාර්තමේන්තුව වෙත 0112665584 අංකය ඔස්සේ දුරකථන ඇමතුමක් ලබා දී විෂය භාර නිලධාරීනිය (හසිනි මිය) වෙතින් තහවුරු කිරීමක් ලබා ගත යුතු ය.(මෙම තහවුරුව ලිපියක්/වට්ස්ඇප් පණිවුඩයක්/ෆැක්ස් පණිවිඩයක් හෝ විද්‍යුත් තැපැල යන මාධ්‍ය අතුරින් එක් මාධ්‍යයක් හරහා ලබා ගත යුතු ය.)**

## ඇගයීම් සහ ත්‍යාග

- **ත්‍යාග:**හොඳම නිර්මාණ වෙනුවෙන් **මුදල් ත්‍යාග, ජය සංකේත සහ සහතිකපත්**පිරිනමනු ලැබේ.
- **ප්‍රදර්ශනය :** ප්‍රශස්ථ මට්ටමේ පවතින (හොඳම තත්ත්වයේ) වාර්තා චිත්‍රපට, දෙපාර්තමේන්තු නිල **යූ ටියුබ් (YouTube) නාලිකාවේ**ප්‍රදර්ශනය කෙරේ.

## නොමිලේ පැවැත්වෙන විශේෂ වැඩමුළුව

තරඟයට අයදුම් කරන ඔබ වෙනුවෙන්ම **වාර්තා චිත්‍රපට නිෂ්පාදනය පිළිබඳ වටිනා වැඩමුළුවක්** පැවැත්වීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

- මේ සඳහා ලැබෙන ඉල්ලුම (අයදුම්පත් සංඛ්‍යාව) මත වැඩමුළු පැවැත්වෙන ස්ථාන සහ දිස්ත්‍රික්ක තීරණය කරනු ඇත.